සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අනාවරණ පරීක්ෂණය 2021

7 ශ්‍රේණිය

# නර්තනය

කාලය පැය 02 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

- **සියලුම ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුරු සපයන්න.**
- **අංක 01 - 05 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01 තනි තිතේ ප්‍රභේද ගණන වන්නේ,
(1) 4 කි (2) 3 කි (3) 2 කි (4) 5 කි

02 දේශීය නර්තනයේ දී බෙර වාදනයෙන් තොරව පද කීමෙන් පමණක් අභ්‍යාස කරනු ලබන්නේ,
(1) පා සරඹ හා දොඹින පදය (2) අත් සරඹය හා ඉලංගම් සරඹය
(3) මාත්‍රා පද හා දොඹින පදය (4) පා සරඹය හා ගොඩ සරඹය

03 උඩරට වන්නමක් නර්තනය කර අවසන් කරනු ලබන්නේ,
(1) කස්තිරමෙනි (2) අඩව්වෙනි (3) සීරුමාරුවෙනි (4) කලාසමෙනි

04 තාල රූපයක් සෑදීමට අවශ්‍ය අඩුම මාත්‍රා ගණන,
(1) 3 කි (2) 4 කි (3) 2 කි (4) 1 කි

05 උඩරට හනුමා වන්නම අයත් තාල රූපය තෝරන්න.
(1) 1 2 3 4 / 1 2 3 4 (2) 1 2 3 / 1 2 3 (3) 1 2 / 1 2 3 (4) 1 2 / 1 2

- **ප්‍රශ්න අංක 06 - 10 තෙක් ඇති ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද වරහන් තුළ යොදන්න.**

06 එක් තැනක සිට කරන ''ඉඳගැනීම, සිටගැනීම, ගසක සෙළවීම'' වැනි චලන හඳුන්වනු ලබන්නේ සංචාරී චලන නමිනි. ( )

07 දොම්කිට /// කිට දොම් යනු උඩරට නර්තන සම්ප්‍රදායට අයත් 3 වන ගොඩ සරඹය වේ. ( )

08 ඇත සිටන් එන්නි සෙල්ලි සෙල්ලියේ ......... වැනි රත්න වල්ලි කවි කළගෙඩි නැටුම සඳහා යොදා ගනු ලැබේ. ( )

09 නර්තන කලාවට ප්‍රවේශ වන ආධුනික ශිල්පියා විසින් කළයුතු ප්‍රථම කටයුත්ත වන්නේ තම පාද හසුරුවා ගැනීමට විධිමත් පුහුණුවක් ලැබීමයි. ( )

10 දේශීය වාද්‍ය භාණ්ඩයක් වන දවුල සන්නිවේදන කාර්යයන්හි දී බහුලව යොදා ගනී. ( )

- **ප්‍රශ්න අංක 11 - 15 දක්වා නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.**
(ද්‍රවිඩ / මිටිරියන / සුළුතනි තිතට / පහතරට / තාලානුකූල)

11 සෝෂක බෙරය ..................................................... නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය වේ.


12 වන්නම් සහ ගීත අනුව නර්තනයේ දී ........................................................ චලන යොදා ගනී.

13 සෙම්බු, කෝලාට්ටම් අයත් වන්නේ ........................................................................ ජන නැටුම්වලට ය.

14 මැණ්ඩියට සිටීමේ දී පාද අතර තබා ගත යුතු දුර ප්‍රමාණය ............................................... කි.

15 'කුඳ ගත ගත දොං' යන බෙර පදය .......................................................................... අයත් වේ.

- **ප්‍රශ්න අංක 16 - 20 දක්වා ප්‍රශ්නවලට අදාලව ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.**




හරහට

16 ගසේ ආයු කාලය අවසානයේ දී පිපෙන මලකි.

17 සැම පාසරඹ පදයක් අවසානයේ දී නටනු ලබන පදයයි.

18 සුළු මැදුම් (2 + 3 ) දෙතිතට කරනු ලබන වන්නමකි.

පහළට

19 පළමුවන පා සරඹ පදය වේ.

20 පා සරඹ නර්තනයේ දී වාදනය කරනු ලබන තාල වාද්‍ය භාණ්ඩය වේ. (ලකුණු 20)

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.**

01 'වන්නම් ' සහ 'තලමල වරුණ' කවිවලින් සමාජ හා සංස්කෘතික පසුබිම ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) උඩරට වන්නම් හා සබරගමු වන්නම් රචනා වීමේ ප්‍රධාන අරමුණ කුමක්ද? (ල. 02)

(ii) උඩරට නර්තන සම්ප්‍රදායේ වන්නම් ගණන කීයද? (ල. 02)

(iii) පහතරට වන්නම් හඳුන්වන නාමය සහ වන්නම් ගණන ලියන්න. (ල. 02)

(iv) තලමල පිබිදීම පිළිබඳ ගැමි ජන සමාජයේ පවතින විශ්වාසය කුමක්ද? (ල. 02)

(v) එදා ගැමියා තලමල කපා ගමෙන් ඉවතට ගෙන ගියේ කෙසේද? (ල. 02)

02 ආධුනිකයාගේ මූලික අංගහාර ගොඩනැගීම සඳහා සරඹ අභ්‍යාස කිරීම ඉතා වැදගත් වේ.

(i) දණ්ඩි කඳ භාවිත කරනු ලබන්නේ කුමක් සඳහා ද? (ල. 02)

(ii) 4 වන ගොඩ සරඹයේ සරඹ නාමය ලියා කස්තිරම ලියන්න. (ල. 04)

(iii) නම්‍යතා අභ්‍යාස කිරීම මගින් ලැබෙන ප්‍රයෝජන 02 ක් ලියන්න. (ල. 04)

03 ප්‍රායෝගික ව භාවිත කරන නර්තනයට අදාල අංග ලිඛිතව සටහන් කිරීමේ ක්‍රමය ප්‍රස්තාරකරණයයි.

(i) දෙතිතේ ප්‍රභේද නම් කරන්න. (ල. 02)

(ii) ප්‍රස්තාරකරණයේ දී භාවිත කරනු ලබන සංකේත 4 ක් ඇඳ නම් කරන්න. (ල. 04)

(iii) 'දොං ජිංත ගත දොංත' යන බෙර පදය අදාල තිත් රූපයට ප්‍රස්තාර කරන්න. (ල. 04)

04 ගැමි නැටුම් ගැමියන් විසින් නිර්මාණය කරන ලද නැටුම් විශේෂයකි.

(i) ඔබ දන්නා ගැමි නැටුම් 4 ක් නම් කරන්න. (ල. 02)

(ii) ගැමි නැටුමට ආවේණික පොදු ලක්ෂණ 4 ක් ලියන්න. (ල. 04)

(iii) ඔබ නම් කළ ගැමි නැටුම්වලින් එක් ගැමි නැටුමකට අයත් කවියක් ලියන්න. (ල. 04)

05 පහත සඳහන් එක් එක් තේමා යටතේ අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) වැස්ස තේමාව කොට ගනිමින් චලන නිර්මාණය කිරීමට සුදුසු අවස්ථා දෙකක් ලියන්න. (ල. 02)

(ii) ලී කෙළි නර්තනය අලංකාරවත් කර ගැනීමට යොදා ගත හැකි විකල්ප භාණ්ඩ 2 ක් ලියන්න.(ල. 04)

(iii) තාලානුකූල චලන ඇසුරු කර ගනිමින් නර්තනයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු ගීයක පද කොටසක් ලියන්න. (ල. 04)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01 | 2 | 06 | x | 11 | පහතරට | 16 | තලමල |
| 02 | 1 | 07 | ✓ | 12 | තාලානුකූල | 17 | හමාර පදය |
| 03 | 2 | 08 | x | 13 | ද්‍රවිඩ | 18 | තුරඟා |
| 04 | 3 | 09 | ✓ | 14 | මිටිරියන | 19 | තෙයි |
| 05 | 4 | 10 | ✓ | 15 | සුළු තනි තිතට | 20 | තාලම්පට |

(1 x 20 = 20)

## II කොටස

01 (i) විනෝදාස්වාදය සඳහා (ල. 02)
(ii) 18 කි (ල. 02)
(iii) සින්දු වන්නම් - 32 කි (ල. 02)
(iv) ගමට අසුභ සංකේතයක් බව (ල. 02)
(v) ගෞරව දක්වමින් හිසමත තබාගෙන හෝ ඇතුපිට තබාගෙන රැගෙන යන ලදී. (ල. 02)

02 (i) නර්තනයට සුදුසු ආකාරයට මණ්ඩිය සහ පාද නිවැරදි ලෙස සකස් කර ගැනීම සඳහා (ල. 02)
(ii) සිව් අඩිය
ගත්තකු ජිත්තම් ගජතකු ජිත්තම්
ගජිං ජිංත කුඳ ගජතකු ජිත්තම්
තරිකිට ජිත් තරිකිට දොම්කිට තා (ල. 04)
(iii)
* නර්තනය සඳහා අවශ්‍ය ශාරීරික සමබරතාවය හා නිවැරදි හැඩතල සඳහා.
* නීරෝගී පුද්ගලයෙකු වීමට.
* මානසික සුවයක් ඇති වීමට.
* ශාරීරික ප්‍රසන්න බව ඇති වීමට.
* රසවින්දන හැකියාව වර්ධනය වීමට.
* අභියෝගවලට මුහුණ දීම හා දරා ගැනීමේ හැකියාව ඇති වීම.
* කායික සංවර්ධනයක් ඇති වීම. (ල. 04)

03 (i) සුළු මැදුම් දෙතිත
සුළු මහ දෙතිත
මැදුම් මහ දෙතිත (ල. 02)
(ii) ^ - තිත්
/ - තෙයි
- - - මාත්‍රාවක් ඇදෙන බව
\+ - අවග්‍රහය
‿ - අක්ෂර කිහිපයක් එකතු කිරීම (කැටි කිරීම) (ල. 04)
(iii)

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ^ 1 | 2 | / 1 | 2 | 3 | ^ 1 | 2 | / 1 | 2 | 3 |
| දොං‿ | - | ජිං‿ | - | ත | ග | ත | දොං‿ | - | ත |

(ල. 04)

04 (i) කුලු නැටුම්, කළ, ලී කෙලි , රබන්, සවරන්, ගොයම් නැටුම් ආදී වශයෙන් (ල. 02)
(ii) සරල පද නිර්මාණය
විනෝදාස්වාදය අරමුණු කර ගැනීම
සාමූහිකව නර්තනය කිරීම
එක් එක් නර්තනයට ආවේනික වූ ගායනා තිබීම
ස්ත්‍රී / පුරුෂ/ළමා/ තරුණ/ වැඩිහිටි භේදයකින් තොරව සැමට සහභාගී විය හැකි වීම
උපකරණ භාවිතය (ල. 04)
(iii) නම්කළ නැටුමක කවියක් ලියා තිබීම (ල. 04)

05 (i) සුළඟ හැමීම, ගස් සෙලවීම, වතුර ගැලීම, විදුලි කෙටීම (ල. 02)
(ii) එක්ස්රේ බෙරය, ටින් බෙරය, ටොනිකත් පියන් වළල්ල ආදී වශයෙන් (ල. 04)
(iii) පද කොටස ලියා ඇත්නම් (ල. 04)

*සියලුම හිමිකම් ඇවිරිණි*
*All Rights Reserved*

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# අනාවරණ පරීක්ෂණය 2021

7 ශ්‍රේණිය

# නර්තනය

## ප්‍රායෝගික පරීක්ෂණය

01 (i) කැමති ගායනයක් කිරීම

(ii) නම් කරන ලද ගායනයක්) (ලකුණු 5 x 2 = 10)

02 4,5,6 පා සරඹවලින් එක් පා සරඹයක් නර්තනය කර, හමාර පදය නර්තනය කිරීම (ලකුණු 10)

03 3,4 ගොඩ සරඹවලින් එක් ගොඩ සරඹයක් නර්තනය කර , කස්තිරම නර්තනය කිරීම (ලකුණු 10)

04 හනුමා වන්නමේ කවියක් ගායනා කරමින් මාත්‍රා දෙකක් නර්තනය කිරීම (ලකුණු 10)

05 වැස්ස ගැන කියවෙන ඔබ කැමති කවියකට නර්තනයක් ඉදිරිපත් කිරීම (ලකුණු 10)

(මුළු ලකුණු 10 x 5 = 50)